රුහුණ විශ්වවිද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
දෙවන සමාසික අවසාන පරීක්ෂණය - 2019 අගෝස්තු

**MAE 5203 - ලෝක ආර්ථික ප්‍රවණතා**

කාලය : පැය 03 යි.

**ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.**

---

01. i. "ගෝලීය ත්‍රස්තවාදය" (Global Terrorism) යන සංකල්පය නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. ඉතා මෑතකාලීන ව ගෝලීය ත්‍රස්තවාදයට මුහුණ දුන් ඔබ දන්නා ඕනෑම රටක අත්දැකීම් ආශ්‍රයෙන් එවැනි සිදුවීමක ඒක්ෂණ (ආසන්නතම) සහ ප්‍රවෛගික (ගතික) ආර්ථික ප්‍රතිවිපාක විමසන්න.

(ලකුණු 09)

iii. ගෝලීය ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමෙහි ලා ජගත් ප්‍රජාවට ගත හැකි විකල්ප උපාය මාර්ග ලේඛනගත කරන්න.

(ලකුණු 03)

02. "මෑතකාලීන ගෝලීය ආර්ථිකය තුළ ආසියානු කලාපයෙහි යම් ආර්ථික පුනරුදයක් ඉස්මතුව පැවතියත්, බටහිර සම්ප්‍රදායික දියුණු ජාතීන් සමකාලීනව අත් විඳින සමාජ ආර්ථික තත්ත්වයන් සමඟ සසඳන කල ආසියානු ආර්ථික සාර්ථකත්වයේ ප්‍රබල හිඩැසක් පවතී." සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

03. i. ශ්‍රී ලංකාව වැනි කුඩා විවෘත ආර්ථිකයක ආර්ථික වර්ධන අරමුණු ඉටුකර ගැනීමට ගනු ලබන ප්‍රයත්නයේ දී විදේශීය ඍජු ආයෝජනයේ ඇති අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii. ශ්‍රී ලංකා ආර්ථිකය වර්තමානයේ මුහුණපා සිටින ආර්ථික අභියෝග ජය ගැනීම සඳහා විදේශීය ඍජු ආයෝජන ප්‍රවාහ භාවිත කළ යුතු ප්‍රතිපත්තිමය ක්‍රමවේදයන් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

04. i. හරිත වර්ණ ක්ෂේත්‍රීය (Green Field) විදේශීය ඍජු ආයෝජනය සහ දුඹුරු වර්ණ ක්ෂේත්‍රීය (Brown Field) විදේශීය ඍජු ආයෝජනය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. ප්‍රශ්න අංක 04 i. හි සඳහන් එක් එක් විදේශ ඍජු ආයෝජන මූලෝපායන්හි වාසි සහ අවාසි සාකච්ඡා කරන්න.

(ලකුණු 09)

05. "එහි ප්‍රාරම්භක අවධියේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි දැක්ම (Vision) මූලික වශයෙන් 'වෙළඳපොළ අසමර්ථතාව' නමැති න්‍යාය මත පදනම්ව තිබුණත්, වර්තමානයේ දී එය 'ශුද්ධ වෙළෙඳපොළ ක්‍රමය' නමැති මතවාදයේ ආරක්ෂකයා ලෙස කටයුතු කරමින් සිටී.' ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 15)

06. "චීනයේ එක් තීරයක් එක් මාවතක් ප්‍රාරම්භය" (Chaina's One Belt One Road Initiative) යන්න පැහැදිලි කොට ඒ යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ආයෝජන වැඩසටහන් මඟින් මෙරටට ලැබිය හැකි වේ යැයි අපේක්ෂිත සමාජ ආර්ථික වාසි සහ අවාසි පිළිබඳ ඇගයීමක් කරන්න.

(ලකුණු 15)

07. පහත සඳහන් ඒවායින් <u>**දෙකක් (02)**</u> පිළිබඳව සටහන් ලියන්න.

i. ගෙවුම් ශේෂය පිළිබඳ මූල්‍යවාදී ප්‍රවේශය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ණය කොන්දේසි

ii. "ගෝලීයකරණය සහ එහි අසහනයෝ" (Globalization and its discontents)

iii. 2007/2009 ඇමරිකා එක්සත් ජනපදයේ මූල්‍ය අර්බුදය

iv. වෙළෙඳාම හා තීරුබදු පිළිබඳ පොදු සම්මුතිය (GATT) සහ ලෝක වෙළෙඳ සංවිධානය (WTO)

(එක් කොටසකට ලකුණු 08 බැගින් උපරිම ලකුණු 15)

@@@@@@@@@@@@@